# දියමන්ති ව්‍යාපෘතිය

## පුරවැසි අධ්‍යාපනය - 6 ශ්‍රේණිය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියෙහි අදහස, ඉලක්ක හා ක්‍රියාවලිය

'' නිපුණතා පාදක අධ්‍යාපනික ප්‍රවේශය" තුළින් වත්මන් ශ්‍රී ලාංකේය දරු පරපුර තුළ අර්ථවත් ඉගෙනුමක් මත පරිපූර්ණ ජීවිතයකට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, හුරුපුරුදු රෝපණය කොට ඒවා වර්ධනය කර ගැනීමට මගපෙන්වීම් සිදු කර ඇත. පාසල් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ අපේක්ෂාව වනුයේ සක්‍රීය මෙන්ම ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් තුළ අත්දැකීම් ලබා ගැනීමට මගපෙන්වීමත් ඒ මගින් නිපුණතා පූර්ණ සමබර පෞරුෂයක් ඇති පුද්ගලයෙකු සමාජයට හිමිකර දීමත්ය. එහි අවසන් ඵලය වන්නේ අධ්‍යාපන ක්ෂෙත්‍රයට යොදවන යෙදවුම් ප්‍රමාණයට සාපේක්ෂව, ඵලදායි නිමැවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන්, ගෝලීය ප්‍රවණතාවයට සරිලන පරපුරක් බිහි කිරීමත්ය.

එබැවින් සෑම පාසලක ම, සෑම ගුරුභවතෙකු විසින් ම සෑම දරුවෙකුට ම සමාන ඉලක්ක සහිතව ඉගැන්වීම, පාඩම් සැලසුම් කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරීව නිරත කරවීම, පන්ති කාමර ඇගයීම් හා තක්සේරුකරණය ඵලදායී ලෙෂ යොදා ගැනීම හා කාලය සඵලදායි ලෙෂ කලමනාකරණය කර ගැනීමට අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ''දියමන්ති ව්‍යාපෘතිය" හඳුන්වා දී ඇත.

සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් හා ගුණාත්මක යෙදවුම් තෝරා ගැනීමට ගුරුභවතුන්ට අත්‍යවශ්‍ය මගපෙන්වීම පමණක් මෙමගින් ලබා දී තිබේ. ගුරුවරයා තම නිර්මාණාත්මක හැකියාව මත විධිමත්ව ඉලක්ක වෙත ළඟාවිය යුතුය. මෙමගින් නව ලොවට උචිත නිපුණතා පූර්ණ පුරවැසියන් බිහි කිරීම හා එයට ගැලපෙන ගුරු භූමිකාවක් හා ක්‍රියාශීලී පන්ති කාමරයක් සහිත ඉගෙනුම් සංස්කෘතියක් නිදහස් අධ්‍යාපනයට දායාද කිරීම අපගේ අපේක්ෂාවයි.

එස්. කුරුප්පු ආරච්චි
සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

# දියමන්ති ව්‍යාපෘතියෙහි ප්‍රයෝජන

- **මෙම ලේඛන භාවිතා කොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියළුම කණ්ඩායම් මතු සඳහන් උපදෙස් පරිදි කටයුතු කර දරුවන්ට ඉගෙනුම් අවස්ථා වැඩි වශයෙන් ලබා දීමට ක්‍රියා කළ යුතුය.**

1. ගුරුභවතුන් විසින් සෑම ඒකකයක්ම නියමිත කාල වකවානු තුළ නිම කිරීම.
2. ඊට අදාල ඉලක්ක, පැවරුම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ඇගයීම් ලබා දීම.
3. මෙම ඉලක්ක පිළිබඳව දරුවන්, දෙමව්පියන් ආදී සියලුම පාර්ශව දැනුවත් කිරීම. ( ටියුෂන් ගුරුවරු ද මෙම ඉලක්ක අනුගමනය කිරීම ඵලදායි වේ.)
4. පළාතේ සියලුම ඇගයීම් හා වාර පරීක්ෂණ මෙම ඉලක්ක මත ප්‍රමිතිගතව නිර්මාණය කිරීම.
5. විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, අංශ ප්‍රධාන, විෂය ප්‍රධාන යන අභ්‍යන්තර අධීක්ෂණ කණ්ඩායම් ද, ගුරු උපදේශක, විෂය අධ්‍යක්ෂවරු ආදී සියළුම බාහිර අධීක්ෂක කණ්ඩායම් ද මෙම ඉලක්ක අනුව කටයුතු කිරීම.
6. සියලුම අධීක්ෂණ වර්තා මඟින් මෙම ඉලක්ක ළඟාකර ගෙන ඇති ප්‍රමාණය සහ එහි ගුණාත්මක තත්ත්වයන් තක්සේරු කිරීම.
7. ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය සාධනය මැනීමේ දී මෙම ඇගයීම් වාර්තා මත කටයුතු කිරීම.

- තම විෂයයට අදාල කාලය කළමනාකරණය කර ගැනීම සඳහා ගුරුවරයාට ද, විෂයයකට අදාලව උපරිම ඉගෙනුම් කාලයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට ද අධීක්ෂණය හා නියාමනය සඳහා අභ්‍යන්තරව හා බාහිර අධීක්ෂකවරයාට ද, පාසල තුළ විෂය මාලාව නිසි ලෙස කළමනාකරණය පිණිස විදුහලිපතිවරයාට ද, ඇගයීම් ප්‍රමිතිගතව සංවිධානය සඳහා අදාල කණ්ඩායම් වලට ද, දරුවා යන ගමන් මඟ සහ පාසලේ ක්‍රියාවලිය නිසි ලෙස දැකීම දෙමව්පියන්ට ද, පාසලට හා දරුවාට සහාය දීම පිණිස විවිධ බාහිර පාර්ශවයන්ට ද, කළමනාකරණ තීරණ ගැනීම සඳහා කළමනාකරුවන් හා පරිපාලකයන්ට ද මූල්‍ය ප්‍රගතිය හා ඵලය මැනීම සඳහා විගණන නිලධාරයාට මෙම ලේඛනය අතිශය ඵලදායී වේ.

## සමාජයීය විද්‍යා විෂයන් දියමන්ති ව්‍යාපෘතියට . . .

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පළාතට අයිති ග්‍රාමීය නාගරික, ලොකු කුඩා, ජනප්‍රිය හා ජනප්‍රිය නොවන සෑම පාසලක් තුළම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියත්, අභ්‍යන්තර/ බාහිර අධීක්ෂණ ක්‍රියාවලියත්, සම්භවන/සම්පින්ඩිත ඇගයීම් ක්‍රියාවලියත්, නිශ්චිත දින වකවානු, නිශ්චිත ක්‍රමවේද හා නිශ්චිත ප්‍රමිති සහිත ව ක්‍රියාත්මක කිරීම මගින් සෑම දරුවකු සඳහා ම සමාන ඉගෙනුම් අවස්ථා සම්පාදනයත්, අධ්‍යාපනයේ සම අවස්ථා සම්පාදනයත් ඉලක්ක කොටගෙන දියමන්ති ව්‍යාපෘති වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මේ අනුව පළාතේ සමාජ විද්‍යා ගුරු උපදේශකවරුන්ගේත්, විෂය ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ ගුරුභවතුන්ගේත් සම්පත්දායකත්වය ලබා ගෙන සකස් කරනු ලැබූ ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය විෂයයන්ට අයත් අධ්‍යයන ඉලක්ක, ආදර්ශ ඇගයීම් ආකෘති, ආදර්ශ ඉගෙනුම් ආධාරක ආදිය අනුගමනය කිරීම, සැලසුම් සහගත අධ්‍යයන ක්‍රියාවලියකට මග පාදයි. තවද ගුරුවරයාගේ කාලය මනා ලෙස කළමනාකරණයට මග පාදයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සෘණාත්මකව බලපෑමක් කරන, පාඩමට පූර්ව සූදානම සම්බන්ධව ඇතැම් ගුරුවරුන්ගේ තිබෙන ගැටළුත්, ඒකාකාරී ඉගෙනුම් ක්‍රමවේදයන් හේතුවෙන් බහුවිධ හැකියාවන්ගෙන් යුත් දරුවන්ට සිදුවන අවාසිදායක තත්ත්වයනුත් මෙතුළින් නිවැරදි කරගත හැකිය.

මෙහි දී විශේෂයෙන් ම අවධාරණය කළ යුතු කාරණාවක් වන්නේ දියමන්ති ව්‍යාපෘතිය දෙවන අදියර කොටසේ දී අප විසින් ඉදිරිපත් කරන ආකෘතිය ගුරුවරයාට කරන මග පෙන්වීමක් පමණක් වන අතර විෂය උගන්වන ගුරුවරයාගේ දැනුම අත්දැකීම් හා හැකියාවන් මත මෙම මගපෙන්වීම ඔස්සේ විෂය මාලාව නිර්මාණශීලීව සකස් කර ගත හැකිය. ආකෘතියකින් අප ඉදිරිපත් කරන ආදර්ශ ක්‍රමවේදයන්ට සීමා වීම අපේක්ෂා නොකෙරේ. සමාජීයය විද්‍යා විෂයයන්ට අදාළ ගුරු මාර්ගෝපදේශ සහ අනෙකුත් සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණශිලී ඉගෙනුම් අත්දැකීමක් වෙත සිසුන් යොමු කිරීමෙන් මෙහි ඇති ඉලක්ක වෙත වඩාත් සඵලදායි ලෙස ළඟාවීම ගුරුවරයා සතු වගකීම වේ.

ඒ අනුව මෙහි සඳහන් දින වකවානු අනුව ම, පාඩම් ඒකක අවසන් කර අදාළ ඇගයීම්වලට සිසුන් යොමු කිරීම අපේක්ෂා කරන අතර මෙය අප පළාතේ දරුවන් සමබර පෞරුෂයකින් යුක්ත ව සමාජයට දායාද කිරීමට ඔබ දක්වන මාහැඟි දායකත්වයට අත්වැලක් වනු ඇත.

ජේ. ඒ. ඩී. මාලින්ද
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යාව)
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
# (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**6 ශ්‍රේණිය**

**පළමු වාරය - පුරවැසි අධ්‍යාපනය**

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **06** | 6.1 අපේ පාසල | 6.1.1 පාසලේ ආරම්භය හා විකාශනය | මාර්තු 16 | 02 | පැය 01 වි. 20 | |
| | | 6.1.2 පාසලේ සංවිධාන ව්‍යුහය | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.1.3 තමා පිළිබඳ තොරතුරු විමසීම | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.1.4 පාසල් ශිෂ්‍යයෙකු ලෙස සැලසුමකට අනුව වැඩ කිරීම. | | 03 | පැය 02 | |
| | | 6.1.5 පාසල් සංස්කෘතිය | | 03 | පැය 02 | |
| | | 6.1.6 පාසල් ශිෂ්‍යයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳීම. | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.1.7 ගුරු සිසු යුතුකම් පිළිබඳ අවබෝධය | | 01 | වි. 40 | |
| | | 6.1.8 පාසල හා ප්‍රජාව අතර සබඳතාව | | 04 | පැය 02 වි. 40 | |

**දෙවන වාරය**

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | 6.2 අප ජීවත් වන ප්‍රදේශය | 6.2.1 ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් | ජූලි 13 | 07 | පැය 04 වි. 40 | |
| | | 6.2.2 ප්‍රදේශවාසීන් සමඟ සාමූහිකව ජීවත්වීම. | | 06 | පැය 04 | |
| | | 6.2.3 දෛනික ජීවිතයට අවශ්‍යය විවිධ පුද්ගලයින් හා ආයතන | | 07 | පැය 04 වි. 40 | |

## තුන්වන වාරය

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | 6.3 යහපත් පුරවැසියකු ලෙස ප්‍රගුණ කළයුතු ගුණාංග. | 6.3.1 ආචාරශීලීව භාෂාව භාවිත කිරීම | නොවැම්බර් 14 | 02 | පැය 01 වි. 20 | |
| | | 6.3.2 අන්මත ගරු කිරීම. (සක්‍රියව සවන් දීම) | | 01 | පැය 01 වි. 20 | |
| | | 6.3.3 මනා විනයකින් හා ශික්ෂණයකින් කටයුතු කිරීම | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.3.4 සමාජයේ ඇති සරු නිසරු දේ හඳුනාගැනීම. | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.3.5 සමාජ සම්ප්‍රදායන් හා නීතිරීති | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.3.6 සම්පත් අරපිරිමැස්මෙන් පාවිච්චි කරමු | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.3.7 පොදු දේපළ සුරකිමු | | 02 | පැය 01 වි. 20 | |
| | | 6.3.8 පරිසරය සුරකිමු | | 03 | පැය 02 | |
| | | 6.3.9 දේශියත්වය අභිමානයෙන් අගය කරයි. | | 03 | පැය 02 | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
# (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**6 ශ්‍රේණිය**

**පළමු වාරය - පුරවැසි අධ්‍යාපනය**

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 6.1.1 පාසලේ ආරම්භය හා විකාශනය | ආරම්භයේදී හා වර්තමානයේ පාසලේ නම/විදුහල්පති නම ගොඩනැගිලි හා ගුරු ශිෂ්‍යය සංඛ්‍යාව වගුවක සටහන් කිරීම. පාසලේ ශිෂ්‍යය ඇතුළත් කිරීමේ පොත කියවීම. | පාසලෙන් බිහිවූ කීර්තිමත් පුද්ගලයන් සොයා ලිවීම. | සාකච්ඡා | ලොග් සටහන් පොත | පාසල මගින් ප්‍රකාශයට ප්‍රකාශයට පත් කර ඇති සඟරා පුවත්පත් ආදිය. | පාසලෙන් බිහිවූ දීප්තිමත් ආදි ශිෂ්‍යය නාමලේඛනයක් සැකසීම. |
| 6.1.2 පාසලේ සංවිධාන ව්‍යුහය | පාසලේ සංවිධාන ව්‍යුහයේ දළ සැලැස්මක් සැකසීම. පාසලේ දියුණුව සඳහා කැපී පෙනෙන කාර්යයන් ඉටුකර ඇති විදුහල්පතිවරුන් කිහිපදෙනෙකු පිළිබඳව සොයා බැලීම. | පාසලේ ඵලදායිතාව කෙරෙහි බලපාන පාසලේ විවිධ භූමිකා නිරූපණය කරන පුද්ගලයන් නම් කිරීම. | ප්‍රදර්ශන | පාසලේ සංවිධාන ව්‍යුහයේ අන්තර් සබඳතාව දක්වෙන ජාල රූප සටහනක් | පාසලේ ශිෂ්‍යය, ශිෂ්‍යාවන් නිසිපරිදි නිල ඇඳුම භාවිත කරන්නේදැයි උදය රැස්වීමේදී නිරීක්ෂණය කොට සටහන් තැබීම. | ශිෂ්‍ය නායක, නායිකාවන් සතු වගකීම් ලියා දැක්වීම. |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 6.1.3 තමා පිළිබඳ තොරතුරු විමසීම | තමන්ගෙන් පාසලට ඉටුවිය යුතු වගකීම් පිළිබඳ කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීම.<br>ජීව දත්ත තොරතුරු පත්‍රිකා වල ආකෘති සොයා ගැනීම. | තමන්ගේ සංවර්ධනය සඳහා පාසලෙන් ලැබෙන අවස්ථාවලට උදාහරණ ලියන්න. | සාකච්ඡා | නිසිපරිදි සම්පූර්ණ කරන ලද ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක් | තමා තුළ ඇති දුර්වලතා පිළිබඳ ස්වයං අධ්‍යයනයක යෙදී දිනපතා සටහන් තැබීම. | ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක් සැකසීම. |
| 6.1.4 පාසල් ශිෂ්‍යයෙකු ලෙස සැලසුමකට අනුව වැඩ කිරීම. | පාසල් ශිෂ්‍යයෙක් ලෙස කාලය ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට දෛනික කාල සටහනක් සැකසීම.<br>උදෑසන අවදිවන වේලාව දින පොතක සටහන් කිරීම. | සැලසුම් සහගතව වැඩ කිරීමෙන් තමන්ට ලැබෙන ප්‍රයෝජන සංකල්ප සිතියමක දැක්වීම. | සාකච්ඡා | පාසලේ ගුරුවරුන්ට කාලච්ඡේද බෙදා ඇති කාලසටහන | පාසලේ පවත්වන උත්සව වලට දායකත්වය ලබාදීමට මඟපෙන්වීම. | පන්ති කාමරය හෝ පාසල් මිදුල පිරිසිදු කිරීමේ නාම ලේඛනයක් අලංකාර ලෙස සකසන්න. |
| 6.1.5 පාසල් සංස්කෘතිය | පාසලේ පවත්නා නීතිරීති හා සම්ප්‍රදාය වගුගත කරන්න.<br>පාසල් නිල ලාංඡනය ඉවතලන දෑ මඟින් නිර්මාණය කිරීම | පාසලේ දැක්ම හා මෙහෙවර පන්තිය ඉදිරියේ මතකයෙන් ප්‍රකාශ කිරීම. | ප්‍රදර්ශන ක්‍රමය | පාසල් කොඩිය පාසලේ නිල ලාංඡනය | වෙනත් අසල්වැසි පාසලක කොඩිය හා පාසල් ලාංඡන අදාළ පාසලේ යහලුවෙකු මාර්ගයෙන් නිරීක්ෂණය කිරීම. | පාසල් ගීතය නිවැරදි ඉරියව් වල පිහිටා ගායනා කිරීම. |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 6.1.6 පාසල් ශිෂ්‍යයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳීම. | පාසලේදී තමන්ට හිමිවන අයිතිවාසිකම් කිහිපයක් දක්වන්න. (ලිඛිත / වාචික)<br>ළමා අයිතිවාසිකම වෙනුවෙන් කටයුතු කරන ආයතන පිළිබඳ නාමලේඛනයක් සැකසීම. | තමාගෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම් ලැයිස්තුවක් සකසන්න. | සාකච්ඡා | පෙළපොත | තමාගෙන් පාසලට ඉටුවිය යුතු සේවා මැයෙන් රචනයක් ලියා ළමා පුවත්පතකට යැවීම. | පාසලේ භෞතික පරිසරය අලංකාරය සඳහා මල් වගාවන් සැකසීම. |
| 6.1.7 ගුරු සිසු යුතුකම් පිළිබඳ අවබෝධය | ගුරු මණ්ඩලය වෙනුවෙන් තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් ප්‍රකාශ කරන්න. (ලිඛිත / වාචික)<br>ගුරු සිසු සබඳතාව පිළිබඳ දැක්වෙන කවි / ගීත සොයා ලියන්න. | තමන් අන් සිසුන් හා සහයෝගයෙන් කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන සංකල්ප සිතියමක දක්වන්න. | සාකච්ඡා | පෙළපොත | "පාසලට හිතැති වෙමු" යනුවෙන් කවි පන්තියක් නිර්මාණය කිරීම. | ගුරු දිනය වෙනුවෙන් ගුරුවරුන් වෙනුවෙන් සමරු කාඩ්පතක් නිර්මාණය කිරීම. |
| 6.1.8 පාසල හා ප්‍රජාව අතර සබඳතාව | පාසල සමඟ සම්බන්ධ වන ප්‍රජාව දැක්වෙන දළසටහනක් නිර්මාණය කිරීම.<br>පොදු ස්ථානයක් පිරිසිදු කිරීම සඳහා ශ්‍රමදානයක් සංවිධානය කිරීම. | ප්‍රජාවගෙන් පාසලේ දියුණුවට සිදුවන සේවා ලියා දක්වන්න. | සාකච්ඡා | පාසල මඟින් පවත්වා ඇති පොදු කටයුතු පිළිබඳ සඳහන් වන තොරතුරු ඡායාරූප. | පාසලට සේවා සපයන ආයතන වල තොරතුරු එක්රැස් කිරීම. | පාසලේ ශ්‍රමදාන අවස්ථාවක් චිත්‍රයට නැගීම |

## දෙවන වාරය

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 6.2.1 ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් | තම නිවස හා පාසල අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසය නම් කිරීම / ලිවීම.<br>තම නිවස අවට ප්‍රදේශයේ ඇති භෞතික සම්පත් පිළිබඳව සොයා සටහන් කිරීම. | තම ප්‍රදේශයේ ඇති මානව සම්පත් සඳහා උදාහරණ දක්වන්න. | සාකච්ඡා | ප්‍රදේශයේ ඇති භෞතික සම්පත් පිළිබඳ ඡායාරූප, ප්‍රදේශය අයත්වන දිස්ත්‍රික්කය, පළාත, නගරය සටහන් කළ ලංකා සිතියමක්. | තමා අයත් ප්‍රදේශය පිළිබඳව ලියවී ඇති පොතපත, සඟරා, ඡායාරූප | ශ්‍රී ලංකා සිතියමක තමා අයත් ප්‍රදේශය, තම පාසල ඇඳ සටහන් කිරීම. |
| 6.2.2 ප්‍රදේශවාසීන් සමඟ සාමූහිකව ජීවත්වීම. | ප්‍රදේශවාසීන් සහයෝගයෙන් කටයුතු කරන අවස්ථා ප්‍රකාශ කිරීම.<br>සාමූහිකව කටයුතු කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන රූප සටහනක් ආශ්‍රයෙන් දැක්වීම. | සාමූහිකව කටයුතු කරන ආකාරය නාට්‍යානුසාරයෙන් දක්වන්න. | ප්‍රදර්ශන | මිනිසුන් සාමූහිකව ක්‍රියාකරන අවස්ථා දැක්වෙන ඡායාරූප, වීඩියෝ දර්ශන | ප්‍රදේශයේ විවිධ පෙරහැර අවස්ථාවන් නැරඹීම | ප්‍රදේශවාසීන් සහයෝගයෙන් කටයුතු කරන අවස්ථාවක් පෝස්ටරයක් මඟින් දක්වන්න. |
| 6.2.3 දෛනික ජීවිතයට අවශ්‍යය විවිධ පුද්ගලයින් හා ආයතන | ඔබ ප්‍රදේශයේ ජීවත්වන රජයේ නිලධාරීන්ගේ නාමලේඛනයක් සකසා ඔවුන්ගෙන් සිදුවන සේවා සඳහන් කරන්න. | පොදු පහසුකම් ලබාදෙන ආයතන සඳහන් කරන්න. | සාකච්ඡා | ප්‍රදේශයේ ඇති පොදු සේවා ස්ථාන නාම ලියූ පුවරුවක්/ එම ආයතනවල ඡායාරූප ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහජන සෞඛ්‍යය පරීක්ෂක යොදා ගැනීම. | ප්‍රදේශයේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලිස් ස්ථානය ආදියේ දැක්ම හා මෙහෙවර සොයා ගැනීම. | ඔබ ප්‍රදේශයේ ඇති පුස්තකාලයේ පාඨක සමාජයේ ලියාපදිංචි වී අදාළ ලියාපදිංචි වීමේ අංකය රැගෙන එන්න. |

## තුන්වන වාරය

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 6.3.1 ආරාචශීලීව භාෂාව භාවිත කිරීම | ආගමික ස්ථානයක උතුමකු/ මංගල අවස්ථාවක යන අවස්ථාවලදී භාෂාව හසුරුවන ආකාරය පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න. ශාසනික වචන සොයා ලියන්න. | ආචාරශීලී හා ආචාරශීලී බවින් තොර භාෂාව භාවිතයෙන් ඇතිවන යහපත් අයහපත් ප්‍රතිඵල වගුගත කරන්න. | සාකච්ඡා | ආචාරශීලී කථනයේ අංග ලක්ෂණ ලියූ පුවරුවක් | මංගල හෝ අවමංගල අවස්ථාවල උත්සව සභාවල කටයුතු නිරීක්‍ෂණය කිරීම | ගුවන්විදුලි/ රූපවාහිනි සංවාද අවස්ථාවලට සවන්දීම/ නැරඹීම |
| 6.3.2 අන්මත ගරු කිරීම. (සක්‍රියව සවන් දීම) | අන්මත ගරු කිරීමෙන් අපට ලැබෙන වාසි දක්වන්න. (ලිඛිත/වාචික) පන්තියේ මිතුරන් අතර ඇතිවන ගැටුමක දී ඔබ කටයුතු කරන ආකාරය සටහන් කරන්න. | සක්‍රියව සවන් දීමෙන් අපට ලැබෙන වාසි සඳහන් කරන්න. | ප්‍රශ්නාවලි | සක්‍රීය සවන් දීමෙන් ලැබන ප්‍රයෝජන පිළිබඳ සටහන් කළ පුවරුවක් | රූපවාහිනියේ හෝ ගුවන් විදුලියේ සංවාද මණ්ඩපයකට සවන් දීම. | |
| 6.3.3 මනා විනයක් හා ශික්ෂණයකින් කටයුතු කිරීම | පවුල තුල ඔබ විනය හා ශික්ෂණය ඇති කරගන්නා ආකාරය දක්වන්න. මහාමාර්ගයේදී ඔබ දැක ඇති විනය ගිලිහී ඇති අවස්ථා සටහන් කරන්න. | විනය හා ශික්ෂනය ඇති කිරීම සඳහා පන්ති කාරමයේදී විනාඩි 05 ක භවනාවක් සූදානම් කරන්න. | ප්‍රදර්ශන | මහාමාර්ගයේ ගමන් කිරීමේ නිවැරදි ක්‍රම දක්වෙන ඡායා රූප, මාර්ග අනතුරු වල වීඩියෝ දර්ශන | මහා මාර්ගයේදී පොදු දේපළ පරිහරණයේදී කටයුතු කළයුතු ආකාරය පිළිබඳව දක්වෙන පොත්, සඟරා, චිත්‍ර ආදිය පුස්තකාලයට ගොස් පරිශීලනය කරන්න. | |
| 6.3.4 සමාජයේ ඇති සරු නිසරු දේ හඳුනාගැනීම. | ඔබ දකින දැක ඇති සමාජයේ සිදුවන සරු දේවල් නම් කරන්න. (ලිඛිත / වාචික) සරු, නිසරු දේ ලැබීමෙන් සිදුවන සරු ප්‍රතිඵල හා නිසරු ප්‍රතිඵල දක්වෙන ජාතක කතා කියවන්න. | කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීමේ යහපත් ප්‍රතිඵල දක්වෙන භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න. | භූමිකා රංගන | නරක මිතුරන් ඇසුරෙන් ලැබෙන විපාක දක්වෙන ජාතක කතාවක් ඉදිරිපත් කිරීම. | ළඟ ඇති රෝහලකට ගොස් එහි ප්‍රදර්ශනය කර ඇති යහපත් සෞඛ්‍ය පුරුදු නිරීක්ෂණය කර සටහන් කරගන්න. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 6.3.5 සමාජ සම්ප්‍රදායන් හා නීතිරීති | මහමඟදි රියදුරන් හා පදිකයන් පිළිපැදිය යුතු නීතිරීති දක්වෙන පොත් පිංචක් සකසන්න.<br>අපේ රටේ නීති ක්‍රියාත්මක කරන ආයතන වල නම් සොයා ලියන්න. | අතීතයේ සිට පැවත එන සම්ප්‍රදායන් වලට උදාහරණ දෙන්න. | සාකච්ඡා | නීතිරීති සම්ප්‍රදායන් සටහන් කරන සම්ප්‍රදායන් සඳහන් කරන ලද කාඩ්පත්. | සිරිත් විරිත් පිළිබඳ කරුණු සඳහන් වන සිරිත් මල්දම පොත කියවන්න. | |
| 6.3.6 සම්පත් අරපිරිමැස්මෙන් පාවිච්චි කරමු | සම්පත් අරපිරිමැස්මෙන් භාවිතයට ගැනීමෙන් ලැබෙන වාසි සඳහන් කරන්න.<br>ඔබේ ගෙවත්තේ පාංශු ඛාදනය සිදුවන ස්ථානයකට සුදුසු ආකාරයේ ගල් වැටක්, තණපිඩලි ඇල්ලීමක් කරන්න. | "සම්පත් අරපිරිමැස්මෙන් භාවිතයට ගනිමු" මැයෙන් රචනයක් ලියන්න. | ප්‍රදර්ශන | පාසල් වත්ත නිරීක්ෂණයට අවස්ථාව ලබාදී එහිදී ස්වභාවික හා භෞතික සම්පත් හදුන්වා දීම. | පාසලේදී නිවසේදී අරපිරිමැස්මෙන් සම්පත් භාවිතයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ සඳහන් වන පොතපත, සඟරා පරිශීලනය කරන්න. | |
| 6.3.7 පොදු දේපළ සුරකිමු | පොදු දේපළ වල ඡායාරූප එකතුවක් සකසන්න.<br>ඔබ එදිනෙදා ගමන්කරන බස්රථයට මගීන්ගෙන් සිදුවී ඇති හානි නිරීක්ෂණය කර සටහන් කරන්න. | පොදු දේපළ සුරකිමු මාතෘකාව යටතේ කථාවක් කරන්න. | ප්‍රදර්ශන | පොදු දේපළ පිළිබඳ දක්වෙන ඡායාරූප, වීඩියෝ දර්ශන | පොදු දේපළ ආරක්ෂා නොකිරීමෙන් අපට ලැබෙන අවාසි දිනපතා රූපවාහිනිය නැඹීමෙන් හා ගුවනු විදුලියට සවන් දීමෙන් වාර්තා කරන්න. | |
| 6.3.8 පරිසරය සුරකිමු | ස්වාභාවික පරිසරය හා භෞතික පරිසරය වෙන වෙනම හඳුන්වන්න. ලෝක පරිසර දිනයට අදාළව පුවත්පත් වල පළවී ඇති විස්තර ගොනු කරන්න. | "පරිසර සංරක්ෂණයේ වැදගත්කම" බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීම. | ප්‍රදර්ශන | හම්බන්තොට වරාය නෙලුම් පොකුණ අධිවේගී මාර්ග ආදිය වීඩියෝ මඟින් පෙන්වීම. | ශ්‍රී ලංකාවේ ගංගා වල පිහිටීම සිතියමක ලකුණු කරන්න. | |
| 6.3.9 දේශියත්වය අභිමානයෙන් අගය කරයි. | දේශාභිමානය පිළිබඳ දක්වෙන කවියක්/ ගීතයක් ගායනා කිරීම.<br>ප්‍රදේශයේ ඇති ජාතික කෞතුකාගාරය නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. | දේශීය සංස්කෘතියට අදාළ උත්සව/කලා නිර්මාණ/සාහිත්‍ය කෘති පිළිබඳ වගුවක් සකසන්න. | ප්‍රදර්ශන | දේශීය සංස්කෘතිකාංග/ දේශීය නිෂ්පාදන/දේශීය සම්පත් දක්වෙන මල්ටිමීඩියා වීඩියෝ දර්ශන | ශ්‍රී ලංකාවේ දේශාභිමානය පිළිබඳව ලියවී ඇති ගීත එකතුවක පොත් පිංචක් සකසන්න. | |